පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 05 |

# දෙවන වාර පරීක්ෂණය - 2019

# බුද්ධ ධර්මය

පාසලේ නම : ...........................................................................................................

ශිෂ්‍යයාගේ / ශිෂ්‍යයාවගේ නම : ...................................................................... **කාලය - පැය 1 $\frac{1}{2}$**

**01 නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 බුදු ගුණ සිහි කරමින් කරන භාවනාව වන්නේ,
I. මෛත්‍රී භාවනාව II. බුද්ධානුස්සති භාවනාව III. ආනාපානසති භාවනාව

02 බුදුරජාණන් වහන්සේ තුළ තිබූ කිසිවකින් නොසැලුණු ගුණය හඳුන්වන්නේ,
I. පුරිසදම්මසාරථී ගුණය II. අරහං ගුණය III. තාදී ගුණය

03 අප විහාරස්ථානයට ගොස් අනුගමනය කළ යුතු යහපත් පුරුද්දක් **නොවන්නේ,**
I. සන්සුන් ව ගමන් කිරීම. II. තෙරුවන් නැමදීම. III. යහළුවන් සමග ගැටුම් ඇති කර ගැනීම.

04 ආහාර ගැනීමේ දී අනුගමනය කළ යුතු හොඳ පුරුද්දක් **නොවන්නේ,**
I ආහාර ගන්නා විට ඇඟිලි ලෙවකෑම
II කතා කරමින් ආහාර නොගැනීම
III ආහාර ගන්නා විට තලු නොගැසීම

05 සෝමාවතී දාගැබ පිහිටා ඇති ප්‍රදේශය වන්නේ,
I. අම්පාර II. අනුරාධපුරය III. පොළොන්නරුව

06 අනගාරික ධර්මපාල තුමා ආරම්භ කළ පුවත්පතක් වන්නේ,
I. සරසවි සඳරැස II. සිංහල බෞද්ධයා III. බුදුසරණ

07 බුදුරජාණන් වහන්සේ වීණාව උපමා කර ගෙන ධර්මය දේශනා කරන ලද්දේ,
I. රජ්ජුමාලාවට II. සෝණ හාමුදුරුවන්ට III. කොසොල් රජතුමාට

08 සද්ධාතිස්ස රජතුමා විසින් සාදවන ලද චෛත්‍යයක් වන්නේ,
I. ථූපාරාම දාගැබ. II. දීඝවාපි දාගැබ III. සෝමාවතී දාගැබ

09 ශ්‍රී ලංකාවට වැඩම කළ බුදුරජාණන් වහන්සේගේ පා පහස ලද ස්ථාන ගණන වන්නේ,
I. 16 කි. II. 12 කි. III. 8 කි.

10 බුදුරජාණන් වහන්සේ සඳකිඳුරු ජාතකය දේශනා කරන ලද්දේ කවුරුන් උදෙසා ද?
I. රජ්ජුමාලාවට II. කිසාගෝතමියට III. යසෝදරා දේවියට

( ලකුණු 10 )

Education NCP - www.edncp.lk

02 පහත දී ඇත වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

01 ඒකරාජ රජතුමා මෛත්‍රියෙන් යුතු දැහැමි රජ කෙනෙකි. ( )

02 දාන, සීල, භාවනා යනු නව අරහාදි බුදුගුණවලින් එකකි. ( )

03 "ලෝකවිදූ" යනු නව අරහාදී බුදුගුණවලින් එකකි. ( )

04 කල්‍යාණ මිතුරන් ඇසුරු කිරීම තුළින් ජීවිතය යහපත් වේ. ( )

05 සෝමාවති දාගැබෙහි නිදන් කර ඇත්තේ බුදුරජාණන් වහන්සේගේ වම් දළදා වහන්සේය. ( )

06 "උතුම් මිනිසත් බව ලැබීම දුර්ලභය" බුදුරජාණන් වහන්සේ දේශනා කළ සේක. ( )

07 හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා බෞද්ධකොඩිය නිර්මාණය කිරීමට පුරෝගාමී විය. ( )

08 "සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා!" යනු ආනාපාන සති භාවනාවයි. ( )

09 අප සැමවිට ම කිසිවෙකුටත් හිංසා නොකර ජීවත් විය යුතුය. ( )

10 අපි සභාවක් තුළ විනීතව හැසිරිය යුතුය. ( )

( ලකුණු 10 )

03 **A** කොටසට අදාළ පිළිතුර **B** කොටසින් තෝරා නිවැරදිව යා කරන්න .

| A | B |
|---|---|
| 01 සෝමාවතී චෛත්‍යය ඉදි කළේ, | මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමිපාණෝ. |
| 02 අනගාරික ධර්මපාල නමින් ප්‍රසිද්ධ වූයේ | ගිරි අභය රජතුමා. |
| 03 1832 අගෝස්තු 02 දින උපත ලැබුවේ | දොන් ඩේවිඩ් හේවා විතාරණ. |
| 04 "පංචමහා" වාදය සඳහා මූලිකත්වය දැරුවේ, | සද්ධාතිස්ස රජතුමා. |
| 05 දීඝවාපී චෛත්‍යය ඉදි කළේ | හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා. |

( ලකුණු 10 )

04 නිවැරදි පිළිතුර පහත වරහන තුළින් තෝරා හිස්තැන මත ලියන්න .
( අරහං , 5 කි , අක්කෝස බමුණා , දානය , සේරුවාවිල මංගල මහා සෑය , 3 කි )

01 බුදුරජාණන් වහන්සේට ........................................ පරුෂ වචනයෙන් බැණ වැදුණේ ය.

02 ලලාට ධාතූන් වහන්සේ ........................................ නිදන් කොට ඇත.

03 බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ හෙයින් ........................ වන සේක.

04 ගිහි බෞද්ධයෙකු විසින් ආරක්ෂා කළයුතු සිල් පද ගණන ........................ කි.

05 බුදුරජාණන් වහන්සේ ලංකාවට වැඩම කළ වාර ගණන ........................ කි.

06 ........................ මූලික පුණ්‍ය ක්‍රියා තුනෙන් එකකි.

( ලකුණු 12 )

05 පහත දී ඇති කවි සම්පූර්ණ කරන්න.

01 රහසත් පව් නොකොට

කෙලෙසරයනුත් දුරු කොට

........................................................................

........................................................................

Education NCP - www.edncp.lk

02 වැඩිහිටි බසකට වාද නොගන්නෙමි

------------------------------------------------------------

------------------------------------------------------------

මම හොඳ දරුවෙකු ලෙස හැසිරෙන්නෙමි ( ලකුණු 08 )

**06 හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර වරහන තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

01 වර්ෂ 1907 පෙබරවාරි 17 දින මදුරාසියේ දි ------------------------------ පරලෝ සැපත් විය.

( හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා , අනගාරික ධර්මපාල තුමා )

02 බුදුරජාණන් වහන්සේගේ අකු ධාතූන් වහන්සේ නිදන් කර ඇත්තේ ------------------------------ ය.

( ථූපාරාමය , දළදා මාලිගාව )

03 බුදුරජාණන් වහන්සේ ලක්දිවට වැඩි ------------------ අවස්ථාවේ දී දීඝවාපියට වැඩි සේක.

( දෙවෙනි , තෙවැනි )

04 බුදුරජාණන් වහන්සේ රජ්ජුමාලාවට පිහිට වීමෙන් ------------------ ගුණය පිළිබිඹු කරයි.

( මහා කරුණා , නිහතමානි )

05 ------------------ යනු තෙරුවන් වලින් එකකි. ( දානය / බුද්ධ ) ( ලකුණු 10 )

**07 පහත එක් එක් කියමන් කීවේ කවුරුන් විසින් කා හටද යන්න ලියා දක්වන්න.**

01 "මහරජතුමනි, මා සමඟ යසෝදරාවගේ කුටියට යමු"

කීවේ කවුද? ------------------------------------------------

කා හට ද? ------------------------------------------------

02 "වීණාවේ තත් වැඩියෙන් හිර කළොත් ස්වර වාදනය කරන්න පුළුවන් ද?"

කීවේ කවුද? ------------------------------------------------

කා හට ද? ------------------------------------------------

03 "මේ ලෝකේ කිසිවෙකුටත් දත් දීමෙන් මාව පරද්දන්න බෑ"

කීවේ කවුද? ------------------------------------------------

කා හට ද? ------------------------------------------------

( ලකුණු 06 )

**08 කෙටි පිළිතුරු සපයන්න.**

01 සිදුහත් කුමාරයාගේ ගුරුවරයා කවු ද? ------------------------------

02 සිදුහත් කුමාරයා අභිනිෂ්ක්‍රමණය කළේ කුමන පොහොය දිනක ද? ------------------------------

03 සිදුහත් කුමාරයා ඉපදී දින කීයකින් මහාමායා දේවිය කලුරිය කළේ ද? ------------------------------

04 බුදුරජාණන් වහන්සේ පළමු වරට වැඩියේ ලංකාවේ කවර ප්‍රදේශයට ද? ------------------------------

05 තෙමගුල සිදු වූයේ කුමන පොහොය දිනක ද? ------------------------------

06 සද්ධාතිස්ස රජතුමාගේ පියා කවු ද? ------------------------------

Education NCP - www.edncp.lk

07 කාවන්තිස්ස රජතුමාගේ සොහොයුරිය කවු ද? ............................................................

08 අනගාරික ධර්මපාලතුමා සිරි දේවමිත්ත නමින් පැවිදි වී උපසම්පදාව ලැබුවේ කුමන විහාරස්ථානයේ දී ද?

............................................................

( ලකුණු 16 )

**09 පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර ලියන්න.**

01 සතර බ්‍රහ්ම විහරණ පිළිවෙළින් ලියන්න

I ..............................  III ..............................

II ..............................  IV ..............................

02. සොළොස්මස්ථාන අතුරින් 5ක නම් ලියන්න

I ..............................  IV ..............................

II ..............................  V ..............................

III ..............................

03 පහත දී ඇති ශාසනික වචනවල අර්ථය ලියන්න.

I. අමදිනවා - ..............................

II. වඩිනවා - ..............................

III. දෝවනය කරනවා - ..............................

( ලකුණු 12 )

**10. පින්තූර බලා නිවැරදි පිළිතුර ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න**

**A**  ..............................

**B**  ..............................

**C**  ..............................

( ලකුණු 06 )

Education NCP - www.edncp.lk

**බුද්ධ ධර්මය - 5 ශ්‍රේණිය**
**2019 දෙවන වාර පරීක්ෂණය පිළිතුරු පත්‍රය**

01 01 II බුද්ධානුස්සති භාවනාව
02 III තාදි ගුණය
03 III යහළුවන් සමඟ ගැටුම් ඇති කර ගැනීම
04 I ආහාර ගන්නා විට ඇඟිලි ලෙව කෑම
05 III පොළොන්නරුව
06 II සිංහල බෞද්ධයා පුවත්පත
07 II සෝණ හාමුදුරුවන්ට
08 II දීඝවාපි දාගැබ
09 I 16 කි
10 III යසෝදරා දේවිය **(ලකුණු 10)**

**02** 01 ✔ 06 ✔
02 ✘ 07 ✔
03 ✔ 08 ✘
04 ✔ 09 ✔
05 ✘ 10 ✔ **(ලකුණු 10)**

03 01 ගිරි අභය රජතුමා
02 දොන් ඩේවිඩ් හේවා විතාරණ
03 හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා
04 මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
05 සද්ධාතිස්ස රජතුමා **(ලකුණු 10)**

**04** 01 අක්කෝස බමුණා
02 සේරුවාවිල මංගල මහා සෑය
03 අරහං
04 5 කි
05 තුනකි
06 දානය **(ලකුණු 12)**

**05** 01 නිසි වූයෙන් පුදට
අරහ යන නම කියති මුනිඳුට

02 සැමට ම මුදු වදනින් අමතන්නෙමි
ලද උපකාරෙට තුති පුද දෙන්නෙමි **(ලකුණු 08)**

**06** 01 හෙන්රි ස්ටීල් ඕල්කට් තුමා

02 ථූපාරාමයේ

03 තෙවනවර

04 මහා කරුණා ගුණය

05 බුද්ධ **(ලකුණු 10)**

**07** 01 **කවුරුන් විසින්** -බුදුරජාණන් වහන්සේ **කා හටද** - සුද්ධෝදන රජතුමාට

02 **කවුරුන් විසින්** -බුදුරජාණන් වහන්සේ **කා හටද** - සෝණ හාමුදුරුවන්ට

03 **කවුරුන් විසින්** -හාවා **කා හටද** - සක්‍ර දෙවියන්ට

**(ලකුණු 06)**

**08** 01 සර්වමිත්‍ර පඬිතුමා

02 ඇසළ පොහොය දින

03 දින 07 න්

04 මහියංගනයට

05 වෙසක් පොහොය දිනයේ

06 කාවන්තිස්ස රජතුමා

07 සෝමා දේවිය

08 මූලගන්ධකුටියේ දී **(ලකුණු 16)**

**09** 01 I මෙත්තා

II කරුණා

III මුදිතා

IV උපේක්ඛා **(ලකුණු 04)**

02 මහියංගනය මුතියංගනය

නාගදීපය තිස්සමහාරාමය

කැලණිය ශ්‍රී මහා බෝධිය

ශ්‍රී පාදස්ථානය මිරිසවැටිය

දිවාගුහාව දීඝවාපිය **(ලකුණු 05)**

03 I අතුගානවා

II එනවා / යනවා

III සෝදනවා **(ලකුණු 03)**

**10** 01 සෝමාවති දාගැබ

02 දීඝවාපිය

03 මූල ගන්ධ කුටිය **(ලකුණු 06)**

PAST PAPERS WIKI

LOL.lk
Learn Ordinary Level

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

## පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර




- Past Papers
- Model Papers
- Resource Books

for G.C.E O/L and A/L Exams

සමනල දැනුම

විභාග ඉලක්ක ජයගන්න Knowledge Bank

Master Guide

WWW.LOL.LK

CASH ON DELIVERY

HOME DELIVERY

Whatsapp contact
+94 71 777 4440

Website
www.lol.lk

Order via WhatsApp

# 071 777 4440